# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2466/23 - 2025 දෙසැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2025.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1)(අ) වගන්තිය යටතේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ අංක 15 මෙගොඩ කොළොන්නාව කොට්ඨාසයට තේරී පත් වූ මොහමඩ් මිහිලාර් නීලාර් අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ අංක 15 මෙගොඩ කොළොන්නාව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කොස්වත්ත ලියනගේ සංජය මධුෂාන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි පාක්කියරාජා රගුනාදන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් කොස්වත්ත ලියනගේ සංජය මධුෂාන්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ අංක 15 මෙගොඩ කොළොන්නාව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**පී. රගුනාදන්,**
තේරීම්භාර නිලධාරි,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 10 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

EOG 12 - 0058


1A - PG 7396 — 08 (2025/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*